**කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනය - 2018**

---

## 1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

--------------------------------------

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| -------- | ----------- | ----------- | --------- | -------------------- | ----------- |
| ස්ථාවර වත්කම් ලේඛනය - ගොඩනැඟිලි | රු.<br>381,536,572 | රු.<br>- | රු.<br>381,536,572 | 2019 වර්ෂය තුළ දී ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලුම වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසණක සේවා අංශයේ වසර 2 ත් වසර 7 ත් අතර කාලයක සිට පැවත එන රු. 4,985,367 ක් වූ ණය ගැතිශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ලැබිය යුතු ණය මුදල් රාජ්‍ය අංශයේ විවිධ ආයතන සඳහා පරිගණක හෝ මෘදුකාංග සේවා සැපයීම සඳහා ලැබිය යුතු මුදල් වේ. සිහි කැඳවීම් ලිපි යවා ඇතත් බොහෝ රාජ්‍ය ආයතන මෙම ලිපි සඳහා ප්‍රතිචාර දක්වා නොමැත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බැඳුම්කර ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් අයකරගත යුතුව තිබූ රු. 2,465,330 ක ශේෂය සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන නොතිබුණි . | ආර්. සේනානායක මහතාගෙන් 2019 වර්ෂයේ දී මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br>එස්. ජේ පතිරන් මහතාගේ ඉතිරි ශේෂය ලබා ගැනීමට නීතිමය පියවර ගෙන ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 02 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.848,235 ක් වූ උපචිත හා වෙනත් ගෙවීම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් අතුරින් මහාචාර්ය අතුල ගිනිගේ මහතා දැනට ඕස්ට්‍රේලියාවේ ජීවත්වන අතර ඔහු ශ්‍රී ලංකාවට පැමිණි පසු වියදම් දැරීමේ අපේක්ෂාවෙන් ඔහුට අයත් මුදල වන රු.389,911 ක මුදල රඳවාගෙන ඇත. ඉතිරි රු.458,324.00 ශේෂය 2019 වසර තුළ දී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු මුදල් නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,511,337 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු .28, 844,440 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,333,103 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් ආදායමේ වැඩිවීමට සාපේක්ෂව මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නව ට්‍රාන්ස්පෝමරයක් මගින් ආයතනයට අවශ්‍ය විදුලිය ලබාගැනීම වෙනුවෙන් රු. 27,264,245 ක මුදලක් 2017 හා 2018 වර්ෂයන්හිදී වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විදුලිබල සැපයුම ලැබී නොතිබුණි. | විදුලි බල සැපයුම ලබාදෙන ආයතනයන් හි ප්‍රමාදයන් හේතුවෙන් විදුලි බල සැපයුම ලැබීම ප්‍රමාද වී ඇත. | පසුවිපරම් කර සේවය ලබාගැනීම කඩිනම් කර ගත යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට පටහැනි අයුරින් සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නිර්දේශ සහිතව 2006 දෙසැම්බර් 29 දින පරිගණක අධ්‍යයන ආයතනය තුළ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සීමාසහිත තීක්ෂණ සමාගම ස්ථාපිත කර 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි. 2009 මාර්තු 02 දින එය නැවතත් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි. මෙම සමාගම පරිගණක අධ්‍යයන ආයතනයේ සම්පත් භාවිතා කරමින් අධ්‍යයන ආයතන පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලැබේ. සාංගමික ව්‍යවස්ථාවලියේ 32 වන වගන්තිය අනුව එම සමාගමේ කළමනාකරණ මණ්ඩලයට කොළඹ විශ්වවිද්‍යාල පරිගණක අධ්‍යයන ආයතනයේ නිලධාරීන් නිලබලයෙන් පත්විය යුතු බැවින් මෙම සමාගම, පරිගණක අධ්‍යයන ආයතනයෙහි සියයට 100ක පූර්ණ පාලන බලය සහිතව පවතින පරිපාලිත සමාගමක් බව නිරීක්ෂණය කෙරේ. පරිගණක අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩලය කළමනාකරණ මණ්ඩලයෙන් ඉවත් වූ බවට විගණනය වෙත දන්වා සිටියද තීක්ෂණ සමාගමේ ව්‍යවස්ථාවලිය මේ දක්වා සංශෝධනය කර නොතිබුණි . | කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ නිලධාරීන් සීමිත තීක්ෂණ සමාගමේ තනතුරුවලින් ඉවත්වී ඇති අතර සීමිත තීක්ෂණ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කරන ලෙස අප ආයතනයේ කළමනාකරණ මණ්ඩලය හරහා නීත්‍යානුකූලව එම ආයතනයේ වර්තමාන කළමනාකාරීත්වය වෙත දැනුම් දී ඇත. ඒ අනුව අවශ්‍ය සංශෝධන සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගත්බව එම සමාගමේ ලේකම් විසින් විද්‍යුත් තැපැල හරහා අප ආයතනය දැනුවත් කර ඇත | සමාගම නීත්‍යානුකූල කිරීම හෝ පරිගණක අධ්‍යයන ආයතනයට ඇති සම්බන්ධතාවයෙන් ඉවත් වීම හෝ සිදුකළ යුතුය. |

**3.3** අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවිධ ක්‍රියාකාරකම් සඳහා ආයතනය විසින් අරමුදල් 30 ක් පවත්වා තිබූ අතර 2017 සහ 2018 වර්ෂයන්හී එයින් රු. 2,886,372 ක් වටිනා අරමුදල් 05 ක් අදාල අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | මෙම මුදල් උපයෝජනය කරන ලෙස ඒ ඒ අරමුදල් භාවිතය පිළිබඳ අධිකාරී බලය හිමි පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2019 වර්ෂයේ සිට මෙම මුදල් උපයෝජනය කරනු ඇත. | අරමුදල පිහිට වූ කාර්යය සඳහා අරමුදල් යොදාගත යුතුය. |
| (ආ) | 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති පරිපාලනය සහ පොදු කාර්යය ආවරණය කර ගැනීම වෙනුවෙන් ආයතනයේ පවත්වා තිබූ රු. 18,522,348 ක් වූ අරමුදලින් රු. 9,131,505 ක් 2016 වර්ෂයේ ලබාගත් අනුමැතිය පරිදි පරිගණක අධ්‍යයන ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් වෙන් කර තිබුණද වසර 02කට වැඩි කාලයක සිට එම අරමුදල උපයෝජනය කර නොතිබුණි. | ආයතනික අභ්‍යන්තර සිසුන්ගේ පොදු පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් මෙම මුදල 2019 වසර තුළ සැලසුම් කර ඇති කාර්යයන් සඳහා භාවිතා කිරීමට කටයුතු කරනු ඇත. | අරමුදල පිහිට වූ කාර්යය සඳහා අරමුදල් යොදාගත යුතුය. |
| (ඇ) | බාහිර උපාධි අංශයේ තොරතුරු තාක්ෂණවේදී උපාධි (BIT) සංවර්ධන අරමුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 5,940,314 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර අදාල අරමුණ සඳහා අරමුදල් භාවිතා නොකිරීම හේතුවෙන් වර්ෂය අවසානයේදී එම අරමුදලේ රු. 16,714,952 ක ශේෂයක් පැවතුණි. | වර්තමානයේ BIT පාඨමාලාවට ඇති වී තිබෙන අභියෝග වලට මුහුණදීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග වෙනුවෙන් විශේෂයෙන් බාහිර උපාධි මධ්‍යස්ථානය ආයතනයෙන් බාහිරව ස්ථානගත කිරීම සඳහා ගොඩනැලගිල්ලක් මිලදී ගැනීමට මෙම මුදල් ඉදිරියේ දී භාවිතා කිරීමේ අපේක්ෂාවෙන් මෙම අරමුදල ගොඩනගා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | අරමුදල පිහිට වූ කාර්යය සඳහා අරමුදල් යොදාගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කළ යුතු රු.මිලියන 39ක් වටිනා සැපයුම් හා සේවා කටයුතු 05 ක් නිම වී නොතිබුණි. | කොන්ත්‍රාත් ආයතන අදාල කොන්ත්‍රාත් කරගෙන යාමේදී මුහුණ පෑමට සිදු වූ විවිධ ප්‍රායෝගික ගැටලු පිළිබඳ ඔවුන් ගේ ඉල්ලීම් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිසි ඇගයීමක් කර අදාල කොන්ත්‍රාත් නිම කිරීමේ කාළ සීමාව දීර්ඝ කිරීම මෙයට හේතු වී ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව හැකිතාක් දුරට ප්‍රසම්පාදනයන් සිදුකළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.මිලියන 25ක් වටිනා සැපයුම් හා සේවා කටයුතු 04ක වැඩ ආරම්භ කිරීම හා අවසන් කිරීම මාස 1 ½ සිට මාස 07දක්වා ප්‍රමාද වී තිබුණි . | ඒ සියළු ප්‍රසම්පාදනයන් 2019 පළමු කාර්තුව වන විට අවසන් කර ඇත. තවද, මෙම ප්‍රසම්පාදනයන් සඳහා 2018 වසර ආරම්භයේ පැවති විශ්ව විද්‍යාල අනධ්‍යයන කාර්යමණ්ඩල වැඩ වර්ජනයද බලපාන ලදි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව හැකිතාක් දුරට ප්‍රසම්පාදනයන් සිදුකළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 47 ක් පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අත්‍යාවශ්‍ය වූ බාහිර කථිකාචාර්යවරුන් කිහිප දෙනෙකුද ඇතුළුව බාහිර කථිකාචාර්යවරුන් 57 දෙනෙකු දේශන සඳහා සහභාගි කරගෙන රු. 3,037,975 ක මුදලක් ගෙවා තිබුණු අතර අනධ්‍යාන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු සඳහා කාර්යය පැවරුම් පදනම හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 49දෙනෙකු සේවා දිගු ලබා දෙමින් සේවයේ යොදවාගෙන තිබුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලයට සුදුසුකම් සහිත පුද්ගලයන් නොපැමිණීම හේතුවෙන් මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපහසු වී ඇත. බාහිර කථිකාචාර්යවරුන් 57 ගේ සේවය අඛණ්ඩව ලබා ගෙන නොමැති අතර අවශ්‍ය විට වරින්වර ලබා ගැනීම සිදුකර ඇත්තේ අවශ්‍යතාවය මතවේ.<br>අනධ්‍යයන පරිපාලන කාර්ය මණ්ඩලයට අයත් තනතුරු තුළින් බහුතරයක් තනතුරු සඳහා බඳවා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිදුකරනු ලබයි. සීමිත තනතුරු සංඛ්‍යාවක් පමණක් තෝරා පත්කර ගැනීමට ආයතනයට හැකියාව ඇත. | පුරප්පාඩු වූ තනතුරු සඳහා නොපමාව බඳවා ගැනීම් සිදු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක 07 ක් යටතේ වූ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කළ උපායමාර්ග 88 ක තත්‍ය ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී උපායමාර්ග 16 ක ප්‍රගතිය සියයට 31 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. | කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවීම, අපේක්ෂිත අරමුදල් නොලැබීම, මානව සම්පත් ලබාගැනීමේ අපහසුතාවය සහ වෙනත් ප්‍රායෝගික ගැටලු නිසා මෙම ක්‍රියාකාරකම් සියල්ලම නිම කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාල කාලපරිච්ඡේදයේ කාර්යයන් ඉටුකළ යුතුය. |